ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

Asmt_IT_015_S

# ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය ඉදිරිපත් කිරීම හා බදු වාරික ගෙවීම පිළිබඳ උපදෙස් 2018/2019 තක්සේරු වර්ෂය

මෙම උපදෙස් මාලාව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව සැපයීමට නියමිත ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීම පහසුවනු පිණිස නිකුත් කෙරේ.

ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන්, මෙම උපදෙස් මාලාව කියවා එහි අන්තගර්ත කරුණු පිළිබඳව දැනුවත්වීම වඩාත් ඵලදායිවනු ඇත.

මෙම උපදෙස් පත්‍රිකාව; **පොදු උපදෙස්, ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීමේ උපදෙස් සහ ආදායම් බදු වාරික ගණනය කිරීම සඳහා උපදෙස්** වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.

ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය සම්පූර්ණ කිරීමේදී, යම් ගැටළුවක් ඇත්නම් නම්, පහත දුරකථන අංක අමතා වැඩි විස්තර ලබා ගත හැක.

1. 1944 - දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානය
2. 011-2134200 - ජ්‍යෝෂ්ඨ කොමසාරිස් - බදු උපදේශන හා සේවාදායක ප්‍රවර්ධන
3. 011-2134250 - කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
4. 011-2134251 - කොමසාරිස් - බදු උපකාරක සහ සංවර්ධන අංශය
5. දේශීය ආදායම් සියලුම නගර බද සහ ප්‍රාදේශීය කායර්ාල

## 1. <u>පොදු උපදෙස්</u>

2018.04.01 දින සිට ක්‍රියාත්මක 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 90, 91, 92 යන වගන්ති ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘති පත්‍රය පරිදි, ආදායම් බද්දට යටත් සෑම තැනැත්තකුම යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවියයුතු ආදායම් බද්ද පිළිබඳව ඇස්තමේන්තුගත ප්‍රකාශයක්, එම තක්සේරු වර්ෂයේ අගෝස්තු මස 15 දිනට ප්‍රථම කොමසාරිස් ජනරාල් වෙත සැපයිය යුතුය. එම ඇස්තමේන්තුගත බද්ද වාරික හතරකින් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම් කළ යුතුය.

### 1.1 බදු වාරික ගෙවිය යුතු අවසන් දිනයන් පහත පරිදි වේ.

| වාරිකය | | දිනය |
|---|---|---|
| පළමු වාරිකය | - | 2018 අගෝස්තු 15 |
| දෙවන වාරිකය | - | 2018 නොවැම්බර් 15 |
| තෙවන වාරිකය | - | 2019 පෙබරවාරි 15 |
| හතරවන වාරිකය | - | 2019 මැයි 15 |

දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය ප්‍රකාර තක්සේරු වර්ෂය යන්නෙන් මාතර්ු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාල සීමාව අදහස් වේ.

### 1.2 ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය - නිකුත් කිරීම හා භාර ගැනිම

- **නිකුත් කිරිම**

  ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය (SET ආකෘති පත්‍රය) ආදායම් බදු සඳහා ලියාපදිංචි සියලුම තැනැත්තන් වෙත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, එයට අමතරව දේශීය ආදායම් ප්‍රධාන කායර්ාලයේ බදු සේවා අංශයෙන් හෝ ප්‍රාදේශීය කායර්ාල මඟින් ලබාගත හැකි අතර **දේශීය ආදායම් දෙපාතර්මේන්තු නිල වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.**

- **භාර ගැනීම**

  නියමිත පරිදි සම්පූණර් කරන ලද (SET ආකෘති පත්‍රය) ප්‍රකාශය **දේශීය ආදායම් දෙපාතර්මේන්තුවේ ප්‍රධාන කායර්ාලයේ මධ්‍යම ලේඛන කළමනාකරණ** අංශයට **(CDMU) හෝ ඕනෑම දේශීය ආදායම් ප්‍රාදේශීය කායර්ාලයක්** වෙත පැමිණ භාරදිය හැක.

  හෝ

  කොමසාරිස්, මධ්‍යම ලේඛන කළමණාකරන අංශය, දේශීය ආදායම් දෙපාතර්මේන්තුව, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනය වෙත **ලියාපදිංචි තැපෑලෙන්** යොමු කළ හැකිය.

### 1.3 සංශෝධන ඉදිරිපත් කිරීම [91 (5) (1) වගන්තිය]

යම් තැනැත්තකු විසින් සපයන ලද ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය අදාල තක්සේරු වෂර්ය පුරා බලපැවැත්වෙන අතර යම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා දේශීය ආදායම් පනතේ විධිවිධාන සලසා ඇත.

සශෝධිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ විටෙක බදු වාරික ගෙවීම එයට අනුකූලව සිදු කළ යුතුය. යම් සංශෝධිත ප්‍රකාශයක් සැපයීමේදී ආකෘති පත්‍රයෙහි දක්වා ඇති පරිදි, ප්‍රකාශයේ වගර්ය යන්නට ඉදිරියෙන් ✓ සලකුණ යෙදිය යුතුය.

| *(කරුණාකර අදාල කොටුව '✓' සලකුණු කරන්න)* | | | | |
|---|---|---|---|---|
| **ප්‍රකාශයේ වර්ගය** | : **මුල් ප්‍රකාශය** | ☐ | **සංශෝධිත ප්‍රකාශය** | ✓ |

### 1.4 බද්ද හා වාරික ගණනය කිරීමේ විශේෂ විධිවිධාන 203 (5) වගන්තිය

2018/2019 තක්සේරු වෂර්යට සඳහා පමණක් ඇස්තමේන්තුගත ලාභ සහ ආදායම් මත ගෙවිය යුතු ආදායම් බද්ද හා වාරික, පසුගිය තක්සේරු වෂර්යට අදාල බද්දට 5% එකතු කොට ගණනය කිරීමට හැකිවන පරිදි 203 (5) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇත.

### 1.5 ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය ලබාදීම පැහැරහැරීම/ ප්‍රමාද කිරීම

මෙම ප්‍රකාශය නියමිත දිනට ලබා නොදෙන තැනැත්තන් වෙත, දේශීය ආදායම් පනතේ 178 වගන්තිය යටතේ පහත පරිදි දඩ පනවනු ලැබිය හැකිය.

> *ගෙවීමට ඇති බදු මුදලින් 5% ක් සමඟ ප්‍රමාද වන එක් එක් මාසයක කාල සීමාවක් සඳහා ගෙවීමට ඇති බදු මුදලින් 1%* *<u>හෝ</u>* රුපියල් 50,000 සහ ප්‍රමාද වන එක් එක් මාසයක කාලසීමාවක් සඳහා 10,000 බැගින්ද වන දඩයෙන් වඩා වැඩි මුදලට සමාන දඩයකට යටත් වේ. (උපරිම දණ්ඩනය රු.400,000 සීමා වේ. )

### 1.6 වාරික ගෙවීම් පැහැර හැරීම

මෙම වාරික ගෙවීම පැහැරහරින අය සඳහා පහත නීතිමය ක්‍රියාමාගර් ගැනීමට දේශීය ආදායම් පනත අනුව හැකියාව ඇත.

1. 179 (2) වගන්තිය යටතේ විධිවිධාන
   වාරික ගෙවීම සඳහා නියමිත දිනෙන් දින 14ක් ඇතුලත මෙම පනත යටතේ නියම කරන ලද වාරික හෝ ඉන් කොටසක් ගෙවීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදලින් 10% දණ්ඩනයකට යටත් කළ හැක.
2. 159 (1) වගන්තිය යටතේ විධිවිධාන
   යම් ගෙවිය යුතු බදු වාරිකයක් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවලදී වාරිකය හෝ ඉන් කොටසකට 1 ½%ක පොළියක් පැනවීම කළ හැක.

### 1.7 වාරිකය හිලව් කිරීම

ගෙවීම් ප්‍රමාද කිරීම හෝ ප්‍රකාශය ලබාදීම පැහැර හැරීම මත පොළී සහ දඩ පැනවීමක් සිදු කළ අවස්ථාවලදී ඊලඟ වාරිකය ගෙවූ විට, එම පොලිය හා දඩය අයකරගැනීමෙන් පසුව නියමිත වාරිකයට ගැලපීම් කිරීම සිදුවේ. (154 (1) වගන්තිය)

### 1.8 ගෙවීම කළ යුතු ආකාරය

- **ගෙවීම් පත්‍රිකා**
  කාතර්ු හතරට අදාල ගෙවීම් පත්‍රිකා දෙපාතර්මේන්තුව මගින් නිකුත් කරනු ඇත. එයට අමතරව ගෙවීම් පත්‍රිකා **දේශීය ආදායම් ප්‍රධාන කායර්ාලයේ බදු සේවා අංශයෙන්, සියලුම ප්‍රාදේශීය කායර්ාල වලින් සහ ලංකා බැංකු ශාඛාවලින්** ලබාගත හැක.
- **කාල පරිච්ඡේද සම්බන්ධයෙන් වන කේත**
  ගෙවීම් කිරීමේදී කාලපරිච්ඡේද සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි නිවැරදි කේත භාවිතා කළ යුතුය.

| වාරිකය | | කාල පරිච්ඡේද සංකේතය |
|---|---|---|
| පළමු වාරිකය | - | 18191 |
| දෙවන වාරිකය | - | 18192 |
| තෙවන වාරිකය | - | 18193 |
| හතරවන වාරිකය | - | 18194 |

- **ගෙවීම් කළ යුතු බැංකුව - ගෙවීම් ලංකා බැංකු ශාඛාව** හරහා කළ යුතුය.

**1.9 තනි පුද්ගල ආදායම් බදු මත වට්ටම්**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, නියමිත දිනට එක් මසකට පෙර යම් ස්ව තක්සේරු ආදායම් බදු ගෙවීම් සිදුකරන යම් පුද්ගලයන් හට ලබා දුන් 10% ක වට්ටම 2018/2019 තක්සේරු වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවේ.

ඔබ විසින් දැනටමත් 2018/2019 තක්සේරු වර්ෂය සඳහා පළමු කාර්තුමය බදු ගෙවීම් සිදුකර ඇත්නම්, මෙම ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශයේ ඇති ඇස්තමේන්තුගත පළමු බදු වාරික මත අදාළ අඩු කිරීම් කිරීමෙන් ගෙවිය යුතු බදු වාරික ගණනය කර ගෙවීම් කළ හැක.

## 2. <u>ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්</u>

පළමුව ප්‍රකාශයේ ඉහළ කොටසෙහි මෙම ප්‍රකාශය මූලික ප්‍රකාශයද නැතහොත් සංශෝධිත ප්‍රකාශයද යන්නත්; බදු වර්ගය කුමක්ද යන්නත්, ✓ සලකුණ යොදා පැහැදිලිව සටහන් කළ යුතුය.

*(කරුණාකර අදාල කොටුව '✓' සලකුණු කරන්න)*

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ප්‍රකාශයේ වර්ගය** | : **මුල් ප්‍රකාශය** | ☐ | **සංශෝධිත ප්‍රකාශය** | ☐ | | |
| **ආදායම් බදු වර්ගය** | : **සංස්ථාපිත බදු** | ☐ | **තනි පුද්ගල ආදායම් බදු** | ☐ | **වෙනත්** | ☐ |

**2.1 I කොටස ( ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය- පෙර වර්ෂයේ බදු බැඳියාව පදනම්ව)**

මෙම ප්‍රකාශය ලබා දෙන තැනැත්තකු වෙත ගෙවිය යුතු බද්ද හා වාරිකය ගණනය කිරීම සඳහා යම් අපහසුතාවයක් ඇත්නම්, ඒ සඳහා පසුගිය වර්ෂයට අදාල බද්දට 5% එකතු කිරීම මඟින් ගෙවිය යුතු බද්ද හා වාරිකය ගණනය කළ හැක. [203 (5) වගන්තිය] **මෙය 2019.03.31 න් අවසන් වන (2018/19) තක්සේරු වර්ෂයට පමණක් අදාල වේ.**

***(පළමු කොටස සම්පූර්ණ කරන තැනැත්තා දෙවන කොටස සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.)***

**2.2 II කොටස (ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය - පවත්නා වර්ෂයේ ලාභ සහ ආදායම පදනම්ව)**

1. ප්‍රකාශයේ අ, ආ, ඇ, ඈ යටතේ ආදායම් මූලාශ්‍රයන්ගෙන් අපේක්ෂිත ඇස්තමේන්තු ආදායම් වටිනාකම් සඳහන් කරන්න.
2. එම අ, ආ, ඇ, ඈ හි එකතුව **<u>මුළු ඇස්තමේන්තුගත තක්සේරු වන ආදායම</u>** යටතේ සඳහන් විය යුතුයි.

- **අඩු කිරීම් 91(2) (අ) වගන්තිය**

  මුළු ඇස්තමේන්තු බදු වන ආදායම ගණනය කිරීමේදී පනතේ 52 වගන්තිය සඳහන් විධිවිධාන අනුව නියමිත අඩු කිරීම් කළ හැක.

  එම අඩුකිරීම් කළ පසු ඇස්තමේන්තු කරන ලද **<u>මුළු ඇස්තමේන්තුගත බදු වන ආදායම</u>** ලැබේ.

- **ඇස්තමේන්තු මුළු බදු බැදියාව 91 (4) වගන්තිය**

  ඇස්තමේන්තු බද්ද ගණනය කිරීමේදී පනතේ සඳහන් විධිවිධාන අනුව විදේශ බදු ගෙවීමක් (සිදුකර ඇත්නම්, එම ප්‍රමාණය (80 වගන්තිය අනුව) අඩුකිරීම් කළ හැක.

  එලෙස අඩු කිරීම් කිරීමෙන් පසු ප්‍රමාණය <u>**ඇස්තමේන්තු** ගත ගෙවිය යුතු බද්ද</u> ලෙස සැලකිය යුතුය. **වාරික වශයෙන් කොටස් හතරකින් ගෙවියයුතු වන්නේ එම බදු වටිනාකමයි.**

**2.3 III කොටස (ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු මුදල)**

**I කොටසේ සී යටතේ හෝ II කොටසේ ජේ** යටතේ දක්වා ඇති ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු මුදලින් ¼ ක් වාරිකයක් වෙයි.

## 3. <u>ආදායම් බදු වාරික ගණනය කිරීම. 90(3) වගන්තිය</u>

වාරිකය ගෙවීමට ප්‍රථම යම් ගෙවීමක් කර ඇත්නම් ගෙවිය යුතු ත්‍රෛමාසික වාරිකය එම ගෙවීම් ද සැළකිල්ලට ගැනීමෙන් ගණනය කළ යුතුවේ. එබැවින් ගෙවිය යුතු ත්‍රෛමාසික වාරිකයක්, ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බද්දෙන් ¼ ක් නොවිය හැක.

ගෙවිය යුතු ත්‍රෛමාසික වාරිකය (ගෙවිය යුතු සැබෑ වාරිකය) පහත දක්වා ඇති සමීකරණය මගින් ගණනය කරගත හැක.

| $\frac{A - C}{B}$ | | | |
|---|---|---|---|
| | A | - | ඇස්තමේන්තුගත බද්ද |
| | B | - | එම වාරිකය ඇතුලත්ව ගෙවීමට නියමිත මුළු වාරික ගණන |
| | C | - | එම වාරිකයට පෙර ගෙවීම් (මෙයට රඳවා ගැනීම් බදු අගයන්ද ඇතුලත් වේ) |

**ඉහත සමීකරණයේ මෙම වාරිකයට පෙර ගෙවීම් (C ) යන්නෙන් පහත අවස්ථාවන් අදහස් වෙයි.**

1. වාරිකයට පෙර ගෙවූ යම් බදු මුදල් - 90 (3) (අ) වගන්තිය
2. රඳවා ගැනීමේ බද්ද - 90 (3) (ආ) වගන්තිය

***පහත උදාහරණ මඟින් ආදායම් වාරික ගණනය කිරීම් තවදුරටත් පැහැදිලි කර ඇත.***

**උදාහරණ 01 - ආරම්භක අවස්ථාවේ පෙර ගෙවීම් හෝ රඳවා ගැනීම් බදු නොමැති අවස්ථාව**

| | I | II | III | IV |
|---|---|---|---|---|
| A | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 |
| B | 4 | 3 | 2 | 1 |
| C | 0 | 500,000 | 1,000,000 | 1,500,000 |

I. පළමු වාරිකය $\frac{2,000,000 - 0}{4}$ 15.08.2018 ගෙවිය යුතු වාරිකය = රු.500,000

II. දෙවන වාරිකය $\frac{2,000,000 - 500,000}{3}$ 15.11.2018 ගෙවිය යුතු වාරිකය = රු.500,000

III. තුන්වන වාරිකය $\frac{2,000,000 - 1,000,000}{2}$ 15.02.2019 ගෙවිය යුතු වාරිකය = රු.500,000

IV. හතර වන වාරිකය $\frac{2,000,000 - 1,500,000}{1}$ 15.05.2019 ගෙවිය යුතු වාරිකය = රු.500,000

**උදාහරණ 02 - පෙර ගෙවීමක් ඇති අවස්ථාවක්**

2018.07.15 දින රු. 400,000 ගෙවා ඇති බව උපකල්පනය කර ඇත. ඒ අනුව,

| | I | II | III | IV |
|---|---|---|---|---|
| A | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 |
| B | 4 | 3 | 2 | 1 |
| C | 400,000 | 800,000 | 1,200,000 | 1,600,000 |
| | | | | |

I. පළමු වාරිකය $\frac{2,000,000 - 400,000}{4}$ 15.08.2018 ගෙවිය යුතු වාරිකය = රු.400,000

II. දෙවන වාරිකය $\frac{2,000,000 - 800,000}{3}$ 15.11.2018 ගෙවිය යුතු වාරිකය = රු.400,000

III. තුන්වන වාරිකය $\frac{2,000,000 - 1,200,000}{2}$ 15.02.2019 ගෙවිය යුතු වාරිකය = රු.400,000

IV. හතර වන වාරිකය $\frac{2,000,000 - 1,600,000}{1}$ 15.05.2019 ගෙවිය යුතු වාරිකය = රු.400,000

**උදාහරණ 03 - රඳවා ගැනීම් බදු ඇති අවස්ථාවක වාරිකය ගණනය කරන ආකාරය**

2018.07.15 රඳවා ගැනීමේ බදු - 200,000
2019.01.15 රඳවා ගැනීමේ බදු - 100,000

| | I | II | III | IV |
|---|---|---|---|---|
| A | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 2,000,000 |
| B | 4 | 3 | 2 | 1 |
| C | 200,000 | 650,000 | 1,200,000 | 1,600,000 |

I. පළමු වාරිකය $\frac{2,000,000 - 200,000}{4}$ 15.08.2018 ගෙවිය යුතු වාරිකය = රු.450,000

II. දෙවන වාරිකය $\frac{2,000,000 - 650,000}{3}$ 15.11.2018 ගෙවිය යුතු වාරිකය =රු.450,000

III. තුන්වන වාරිකය $\frac{2,000,000 - 1,200,000}{2}$ 15.02.2019 ගෙවිය යුතු වාරිකය =රු.400,000

IV. හතර වන වාරිකය $\frac{2,000,000 - 1,600,000}{1}$ 15.05.2019 ගෙවිය යුතු වාරිකය =රු.400,000

**උදාහරණ 04 - සංශෝධනයක් ලබා දීම**

**බදු ගෙවන්නා විසින් යම් සංශෝධිත බද්ද පිළිබඳ ප්‍රකාශයක් ලබා දුන් අවස්ථාවක, එම කාතර්ුවේ සිට සමීකරණයේ A සඳහා එම බද්ද ආදේශ විය යුතුය. සංශෝධනයේදී බද්ද අඩුවන සංශෝධනයක් හා බද්ද වැඩිවන සංශෝධනයක් ලබා දීමට හැකියාව ඇත.**

2018.08.01 - මූලික ඇස්තමේන්තුව 2,000,000
2019.01.01 - සංශෝධිත ඇස්තමේන්තුව 3,000,000

| | I | II | III | IV |
|---|---|---|---|---|
| A | රු. 2,000,000 | රු. 2,000,000 | රු. 3,000,000 | රු. 3,000,000 |
| B | 4 | 3 | 2 | 1 |
| C | 0 | 500,000 | 1,000,000 | 2,000,000 |

I. පළමු වාරිකය $\frac{2,000,000 - 0}{4}$ 15.08.2018 ගෙවිය යුතු වාරිකය = රු.500,000

II. දෙවන වාරිකය $\frac{2,000,000 - 500,000}{3}$ 15.11.2018 ගෙවිය යුතු වාරිකය = රු.500,000

III. තුන්වන වාරිකය $\frac{3,000,000 - 1,000,000}{2}$ 15.02.2019 ගෙවියයුතු වාරිකය = රු.1,000,000

IV. හතර වන වාරිකය $\frac{3,000,000 – 2,000,000}{1}$ 15.05.2019 ගෙවිය යුතු වාරිකය = රු.1,000,000

## කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

මෙම උපදෙස් මාලාව ඔබගේ පහසුව සඳහා ඉදිරිපත් කර ඇති අතර නිසි පරිදි ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය සම්පූර්ණ කර නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙසත්, ඔබ විසින් ගණනය කරන ලද ආදායම් බද්ද වාරික වශයෙන් නියමිත දිනයට හෝ ඊට පෙර ගෙවන ලෙසත් ඉල්ලා සිටිමි. මෙම උපදෙස් අනුගමනය කිරීමෙන් ඔබට ඉදිරියේදී සිදුවිය හැකි අපහසුතාවයන් මගහැරී යනු ඇත.

ශ්‍රී ලංකාවේ සංවර්ධනය වේගවත් කිරීමෙහිලා නියමිත වේලාවට බදු ගෙවීමෙන් ඔබ දක්වන සහයෝගය, මා පුද්ගලිකවම අගය කරන අතර, ඔබ අප රටේ ගෞරවනීයම පුරවැසියෙකු බවද මෙහිලා සටහන් කිරීම මගේ යුතුකමක් ලෙස සලකමි.

ස්තුතියි,

අයිවන් දිසානායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

**“බදු වගකීමක් නොව සමාජ යුතුකමකි”**